




# පුංචි ගෙදර


රුසියානු ජන කතාවකි




පිට්ටනියක් මැද පුංචි ගෙයක් තිබුණා. මීයා - ඒ ගේ ළඟින් දුව ගෙන ගියා.
පුංචි ගේ දැකලා නැවතිලා කතා කළා.
"පුංචි ගෙයක් - පුංචි ගෙයක්! කවුද මේ පුංචි ගෙදර ඉන්නේ?"
කවුරුවත් උත්තර දුන්නේ නෑ.
මීයා ගේ ඇතුළට ගිහින් ඒ ගෙදර පදිංචි වුණා.




ගෙම්බා - බක බකයා පැන පැන දොරකඩට ඇවිත් කතා කළා.
"පුංචි ගෙයක් - පුංචි ගෙයක්! කවුද මේ පුංචි ගෙදර ඉන්නේ?"
"මම, මීයා - ඔයා කවුද?"
"මම තමයි ගෙම්බා - බක බකයා."
"එන්න ඇතුළට, අපිට එකට ඉන්න පුළුවන්."
ගෙම්බා ගේ ඇතුළට පැන්නා. දෙන්නා එකට ජීවත් වෙන්න පටන් ගත්තා.



ඔන්න එතකොට හාවා - පැන පැන ආවා ගේ ළඟින් දුව ගෙන ගියා.
ගේ දැකලා නැවතිලා කතා කළා.
"පුංචි ගෙයක් - පුංචි ගෙයක්! කවුද මේ පුංචි ගෙදර ඉන්නේ?"
"මම, මීයා"
"මම, ගෙම්බා - බක බකයා. ඉතින් ඔයා කවුද?"
"මම තමයි හාවා - පැන පැන ආවා"
"එන්න ඇතුළට, අපිට එකට ඉන්න පුළුවන්."
හාවා ගේ ඇතුළට පිනුමක් ගැහුවා! දැන් තුන් දෙනා ම එකට ජීවත් වෙනවා.



දවසක් නරිච්චි - ඇවිත් ජනේලයට තට්ටු කරලා කතා කළා.
"පුංචි ගෙයක් - පුංචි ගෙයක්! කවුද මේ පුංචි ගෙදර ඉන්නේ?"
"මම, මීයා"
"මම, ගෙම්බා - බක බකයා"
"මම හාවා - පැන පැන ආවා. ඉතින් ඔයා කවුද?"
"මම තමයි නරිච්චි"
"එන්න ඇතුළට, අපිට එකට ඉන්න පුළුවන්."
නරි පැටික්කි ගේ ඇතුළට රිංගා ගත්තා. දැන් හතර දෙනා ම එකට ජීවත් වෙනවා



ඔය අතර එක් දවසක වෘකයා - දුවගෙන ඇවිත් දොරින් එබිල බලල කුණා කළා.

"පුංචි ගෙයක් - පුංචි ගෙයක්! කවුද මේ පුංචි ගෙදර ඉන්නේ?"

"මම, මීයා"


"මම, ගෙම්බා - බක බකයා"

"මම, හාවා - පැන පැන ආවා."


"මම, නරිච්චි - ඉතින් ඔයා කවුද?"

"මම තමයි වෘකයා"


"එන්න ඇතුළට, අපිට එකට ඉන්න පුළුවන්."




වෘකයා ගේ ඇතුළට බඩ ගෑවා. දැන් පස් දෙනා ම මේ පුංචි ගෙදර එකට ජීවත් වෙනවා. සතුටින් සිංදු කියනවා.
ඔන්න දවසක් හිටි හැටියේම වලහාට මේ ගේ දකින්න ලැබුණා. සිංදු කියනවත් ඇහුණා. වලහා ගමන නවත්තලා මහා හයියෙන් බෙරිහන් දුන්නා.
"පුංචි ගෙයක් - පුංචි ගෙයක්! කවුද මේ පුංචි ගෙදර ඉන්නේ?"



"මම, මීයා"
"මම, ගෙම්බා - බක බකයා"
"මම, නරිච්චි"
"මම, වෘකයා ඉතිං ඔයා කවුද?"
"මම තමයි වලහා"
"එන්න, ඇතුළට අපිත් එක්ක එකට ඉන්න පුළුවන්."
වලහා ගේ ඇතුළට රිංගන්න හැදුවා. රිංගනවා, රිංගනවා, රිංගන්න බෑ.




"මේක හරියන්නේ නෑ.  මං ඔයාලගේ ගේ වහලෙ උඩ පදිංචි වෙන්නම්."
"එතකොට අපේ ගේ කඩා වැටෙයි!"
"අපෝ නෑ.  කඩා වැටෙන්නේ නෑ."
"ආ, එහෙනම් කමක් නෑ.  නගින්න!"
වලහා ගෙයි වහලෙ උඩට නැග්ගා.
හරි බරි ගැහිලා වාඩි වුණා විතරයි - බරාස්!
ගේ පුපුරලා, ඇලවෙලා, බිමට කඩා වැටුණා.




මීයා, ගෙම්බා, හාවා, නරිච්චි, වෘකයා දනිපනි ගාලා සුන්බුන් අතරින් එළියට ආවා.

කවුරුත් සනීපෙන් කාටවත් තුවාලයක් නෑ.



ඊට පස්සේ හැමෝ ම එකතුවෙලා ලී කොටන් කර ගහගෙන ආවා. ඒවායින් ලෑලි ඉරුවා. අලුත් ගෙයක් හදන්න පටන් ගත්තා.
අන්තිමේදී ඒ ගොල්ල තිබුණ එකට වඩා හොඳ ලස්සන ගෙයක් හදා ගත්තා.



955-591-170-3

ප්‍රකාශනය
**සී/ස කුරුලු පොත් (පෞද්) සමාගම**
594/5 නාවල පාර, රාජගිරිය.
දුරකතන - 2863350 / 0777 629787
ෆැක්ස් - 2863350

කවර නිර්මාණය - අනුෂ්කා මල්ලිකාරච්චි

පරිවර්තනය - **එච්. ජයරත්න**
චිත්‍ර - **එන්. රැඩ්ලොව්**
මුද්‍රණය - තරංජී ප්‍රින්ටර්ස්
506, හයිලෙවල් පාර,
නාවින්න, මහරගම.

මිල රු. 120/-